සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය

## නර්තනය

**නම/විභාග අංකය :-** ....................................................................................... **කාලය : පැය 02 යි.**

### I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න**
- **ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. ''සූරිය කුල ඇති හිරුදෙවියන්නේ'' මෙම කවියේ තුන් වන පද පේළිය වන්නේ,

    1. කාරිය කරවා පහදා දෙන්නේ 2. පැවිය අණසක ලොව පවතින්නේ
    3. අතුරු නැතිව සබයේ සිටිමින්නේ 4. මිතුරු ලෙසින් අපි පේළි සැදෙන්නේ

2. ගොප් ගෙඩියක් නිර්මාණයේදී අවශ්‍ය නො වන්නේ,

    1. ගොප් කොළ 2. හඹරල කොළය 3. කෙසෙල් කොටයක් 4. ඉරටු

3. උඩරට/පහතරට/සබරගමු සම්ප්‍රදායන්හි මූලික සරඹ අභ්‍යාස මෙසේ හඳුන්වයි.

    1. පා සරඹ සහ මණ්ඩි පද 2. පා සරඹ හා ඉලංගම් සරඹ
    3. දොඹින පද සහ ඉලංගම් සරඹ 4. පා සරඹ සහ ගොඩ සරඹ

4. නම්‍යතා අභ්‍යාස පුහුණුව මගින් සිදු නොවන්නේ,

    1. ශාරීරික සමබරතාව ඇති වීම 2. ශාරීරික ප්‍රසන්න බව ඇති වීම
    3. මිහිරි කටහඩක් ඇතිවීම 4. මානසික සුවයක් ඇතිවීම

5. පහතරට බෙරයේ දිග ප්‍රමාණය වන්නේ,

    1. එක් වියත් තුනඟුලකි. 2. තුන් වියත් තුනඟුලකි. 3. විග්ගුස්සකි. 4. රියන් තුනකි.

- **හිස්තැන් පුරවන්න.**

6. පා සරඹ / මණ්ඩි පද නර්තනය කොට අවසන් කරනු ලබන්නේ .................................. පදයෙනි.
7. ජේ.ඊ. සේදරමන් මහතා ..................................................... සම්ප්‍රදායේ ප්‍රවීන නර්තන ශිල්පියෙකි.
8. පඬුවස්දෙව් රජතුමා සම්බන්ධ කතා පුවත ඇතුළත් ශාන්තිකර්මය වන්නේ ................................................................. යි.
9. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ මෙන් ම ..................................................... වාද්‍ය උපකරණයන් ද සමූහ වාදනයේදී යොදා ගනී
10. නර්තන කලාවට අධිපති දෙවියන් වන්නේ ............................................................. ය.

● අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශයන් හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද වරහන් තුළ යොදන්න.

11. නර්තන, ගායන, වාදන අවස්ථාවලදී තාල තැබීම සඳහා ගැටබෙරය යොදා ගනී. ( )

12. කාවඩි ද්‍රවිඩ ගැමි නැටුමකි. ( )

13. උඩරට නර්තන සම්ප්‍රදායේදී අත් සරඹ (ගොඩ සරඹ) පහතරට නර්තනයේදී ඉලංගම් සරඹ ලෙස හඳුන්වයි. ( )

14. ''සවරං'' කවි අනාඝාතාත්මක ගායන විශේෂයකි. ( )

15. උඩ පල ගත්තත් වට්ටක්කා යන රබන් පදය මාත්‍රා 3 තනි තිතට වාදනය කල හැකිය ( )

● A කොටසට වඩාත් ගැලපෙන පිළිතුර B කොටසින් සොයා නිවැරදිව යා කරන්න.

| | |
|---|---|
| 16. නම්‍යතා අභ්‍යාස | a රන් තෙළඹු වර්ණනාව |
| 17. කලඑළි මංගල්‍යය | b මිටිරියන |
| 18. මණ්ඩිය | c උපවාස කාලය |
| 19. රාමසාන් | d අංග, ප්‍රත්‍යාංග, උපාංග |
| 20. කුළු නැටුම | e දියකොරහෙන් මුහුණ බැලීම |

## II කොටස

● පළමු වන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න
(1).

1. තාලය හා සම්බන්ධ ප්‍රබේද .................................. කි.

2. කොහොඹා කංකාරියේ ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය වන්නේ .................................................................... යි.

3. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය .................................................................. යි.

4. හේවිසි වාදනයේදී යොදා ගන්නා ''විතත'' වාද්‍ය භාණ්ඩයක් ලෙස ..............................................................දැක්විය හැකිය.

5. ශ්‍රී ලංකාවේ ජීවත් වන ද්‍රවිඩ ජනයාගේ සාම්ප්‍රදායික නර්තනය ....................................................................... ලෙස හඳුන්වයි.

6. රද්දූල්ලේ පොඩි මහත්මයා ............................................ නර්තන සම්ප්‍රදායේ දක්ෂ නර්තන ශිල්පියෙකි.

7. සමබරතාව තබා ගනිමින් නර්තනය කරන ඉන්දියානු ගැමි නැටුමකි. .......................................................

8. පිල් දෙකක් අතර කඹ ඇදීමේදී ඔවුන් තුළින් නිරූපිත භාවය ....................................................... ලෙස හැඳින්වේ.

9. ගුරු අක්ෂරයකට හිමි මාත්‍රා ගණන වන්නේ ..................................... කි

10. ශරීරයේ විවිධ ස්ථානවලට රංග උපකරණයෙන් තට්ටු කරමින්, හඬ නිපදවමින්, ............................................. නම් වූ ගැමි නැටුම නටනු ලැබේ.

(2)

1. තුරඟා වන්නම / භාවාදී තාලය සින්දු වන්නම / කුදිරඩි වන්නමට අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න. (ලකුණු 6)
2. එම වන්නමට අයත් තානම සහ කවියක් ලියන්න. (ලකුණු 6)
3. ඊට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම ලියන්න. (ලකුණු 8)

(3)

1. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දක්වන්න. (ලකුණු 6)
2. පහත රට නැටුම් සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් ඇඳ කොටස් 4 නම් කරන්න. (ලකුණු 6)
3. එම වාද්‍ය භාණ්ඩය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 8)

(4)

1. නවරාත්‍රී උත්සවයේදී පුද ලබන දෙවිවරුන් තිදෙනා නම් කරන්න. (ලකුණු 6)
2. නවරාත්‍රී උත්සවය පැවැත්වීමේ හේතු 3 ක් දක්වන්න. (ලකුණු 6)
3. නවරාත්‍රී උත්සවයෙහි දැකිය හැකි නර්තන, ගායන, වාදන අවස්ථා පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 8)

(5)

1. සරල ගොප් සැරසිලි අංග 3 ක් නම් කරන්න. (ලකුණු 6)
2. ගොප් ගෙඩිය භාවිතයට ගන්නා අවස්ථා 3 ක් නම් කරන්න. (ලකුණු 6)
3. ගොප් ගෙඩියට සුදුසු සරල ගොප් කැටයමක් අඳින්න (ලකුණු 8)

(6) පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1. | මුල්කිරිගල | සිතුවම් | සීගිරිය |
| 2. | ලී කැටයම් | ගඩලාදෙණි විහාරය | දෙවින්දර දේවාලය |
| 3. | ඇම්බැක්ක දේවාලය | මහා වංශය | ගල් කැටයම් |

1. නර්තන කලාව පිළිබඳ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර යටතේ ''රූකම්'' බෙදෙන කොටස් තුනක් වගුවෙන් තෝරා ලියන්න (ලකුණු 4)
2. ගල් කැටයම් සම්බන්ධ තොරතුරු සොයා ගත හැකි ස්ථානයක් වගුවෙන් තෝරා ඒ පිළිබඳ තොරතුරු දක්වන්න. (ලකුණු 8)
3. ලී කැටයම් සහිත ස්ථානයක් වගු-වෙන් තෝරා නර්තන කලාවේ ඓතිහාසික පසුබිම් විස්තර කරන්න. (ලකුණු 8)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**Answers**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය

## නර්තනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

1 - 20 දක්වා කෙටි ප්‍රශ්වලට පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. 1 | 2. 2 | 3. 1 | 4. 3 |
| 5. 2 | 6. හමාර පදය | 7. උඩරට | 8. කොහොඹා කංකාරිය |
| 9. විකල්ප | 10. ශිව/නටරාජ් | 11. x | 12. √ |
| 13. √ | 14. x | 15. x | 16. d |
| 17. e | 18. b | 19. c | 20. a |

(ලකුණු 2x20=40)

### II පත්‍රය

(01)

1. 3 (තුන) 2. වෙස් ඇඳුම් කට්ටලය 3. දෙවොල් මඩුව 4. තම්මැට්ටම 5. භරත නාට්‍යම්
6. සබරගමු 7. කරගම් 8. උත්සාහය 9. 2 10. පතුරු

(ලකුණු 2x10=20)

02.

1.

| | ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| උඩරට | දොං | - - | ජිං | - | ත | ග | ත | දොං | - - | ත |
| පහතරට | දිං | - - | ග | ති | ත | ග | ත | දොං | -- | ත |
| සබරගමු | ජිං | - - | ජි | මි | ත | තත් | - | ත | ක | ට |

ප්‍රස්තාරයේ විභාග සංකේත සඳහා (ලකුණු 2යි)
බෙර පදය ප්‍රස්තාර කිරීමට (ලකුණු 4යි)
2. තානම හා කවියක් ලියා ඇත්නම් (ලකුණු 3x2=6)
3. එම වන්නමෙහි අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම සම්පූර්ණව ලියා ඇත්නම් (ලකුණු 8යි)
(මුළු ලකුණු 20)

(03)

1. උඩරට - ගැටබෙරය, පහතරට - පහතරට බෙරය, සබරගමු - දවුල (ලකුණු 6 යි)
2. නිවැරදිව රූපසටහන ඇඳීම (ලකුණු 2 යි)
කොටස් හතර නම් කිරීම (ලකුණු 4 යි)
3. භාවිත නම්, අමු ද්‍රව්‍ය, මිම් ප්‍රමාණ, වාදන අවස්ථා දක්වා ඇත්නම් (ලකුණු 8 යි)
(මුළු ලකුණු 20)

(04)

1. ලක්ෂ්මි දෙවියන්, දුර්ගා දෙවියන්, සරස්වතී දෙවියන්, (ලකුණු 2x3=6)
2. දෙවියන් පිදීම, සශ්‍රිකත්වය හා සෞභාග්‍ය ප්‍රාර්ථනා කිරීම, අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම (ලකුණු 2x3=6)
3. නර්තන - විශේෂ නර්තනයක් නැත
ද්‍රවිඩ ජනයාට ආවේණික වූ නර්තනාංග උදා:- කෝලාට්ටම්, සෙම්බු
ගායන - තේවාරම් නමැති ගායන විශේෂය
සකලකලා වල්ලි මාලෙයි නම් ගායනය

වාදන - තවිල් බෙර වාදනය
ස්තෝත්‍ර ගායන සමග පද කොටස් වාදනය (ලකුණු 8)

05. 1. නෙළුම් මල, හත් අඩියේ පියුම, ගොප් කොළ කුරුල්ලා, ගොප්ගෙඩිය (ලකුණු 2 x 3 = 6)
2. උත්සව අවස්ථාවන්හිදී වේදිකා අලංකරණය සඳහා
පිරිත් මණ්ඩප අලංකරණය සඳහා
මංගල පෝරු අලංකරණය සඳහා (ලකුණු 2 x 3 = 6)
3. පැහැදිලිව ගොප් කැටයම ඇඳීමට (ලකුණු 8)

06. 1. ලී කැටයම්, සිතුවම්, ගල් කැටයම් (ලකුණු 4)
2. ගඩලාදෙණි විහාරය (ලකුණු 4) සාධක විස්තර කිරීම (ලකුණු 4) (ලකුණු 8)
3. ඇම්බැක්ක දේවාලය (ලකුණු 4) පසුබිම් විස්තර කිරීම (ලකුණු 4)
(ලකුණු 8)